ත්‍රෛමාසික මෙහෙවරක අන්තර්ජාල ප්‍රකාශය

සිතුවම

2024 මාර්තු - මැයි කලාපය

රටට ණය නැති - වැඩට බය නැති නිල දරුවෝ - 04

වළගම්බා රජ දවස යුධ පුහුණු බිමක් - 06

සතේ කවි - 09

මම මුලින්ම රසකැවිලි හදන්න පුරුදු වුණේ මගේ නැන්දම්මාගෙන් - 10

විනාඩි 5න් සහතික ඔබේ අතට - 11

සිතුවම
නිලු ප්‍රියදර්ශනී
එඩිගල වසම

වරකාපොල ප්‍රාදේශීය මහලේකම් කාර්යාලීය ප්‍රකාශනයකි

සතුට....

එකමත් එක රටක රජ කෙනෙක් හිටියා. ඒ රජුට ප්‍රීතිය හැර සියලුම සැප සම්පත් තිබුණා. ඇදුම් පැලඳුම් යාන වාහන කෑම බීම ඕනෑ තරම්. රටේම රූපයෙන් අග තැන්පත් රජ බිසවක් වගේම රූමත් අන්තඃපුර බිසව්වරුද දැසි දස්සන්ද මහ පිරිවරද සිටියා. මේ කොයිතරම් සැප සම්පත් තිබුණත් මේ රජුගේ හිතේ සතුටක් තිබුණේ නැහැ. මේ නිසා රජතුමා දිවා රෑ නොයිවසිල්ලෙන් නොසතුටෙන් දුකෙන් කාලය ගත කළා.

“මට හැම සැප සම්පතක්ම තියෙනවා. ඒත් මට ප්‍රීතිය නැහැ.මට ප්‍රීතිය ගෙනත් දීපල්ලා”

දවසක් රජු මහ හයියෙන් කෑ ගහලා කීවා. හැමෝම රජුට කතා කරන්න බය වුණා. වේදනාව දරාගන්න බැරිව ඉන්න රජු දෙස තවත් බලාගෙන ඉන්න බැරිව රජ මාළිගයේ සේවය කළ එක් සේවකයෙක් රජුට මෙලෙස පැවසුවා.

“සමාවී වදාරන්න දේවයන් වහන්ස ඔබතුමා කොහොමහරි සොයාගන්න ප්‍රීතියෙන් ඉන්න මනුස්සයෙක්. ඒ මනුස්සයාගේ කමිසය ඉල්ලගෙන ඔබ වහන්සේ ඇද ගන්න. ඒ කමිසයේ ගැවිලා තියෙනවා ඒ මනුස්සයාගේ ප්‍රීතිය. එතකොට ඒ ප්‍රීතිය ඔබවහන්සේගේ ශරීරයට උරා ගනීවී. එතකොට ඔබවහන්සේට ප්‍රීතිමත් වෙන්න පුලුවන්.”

“කදිම අදහසක් ”

රජතුමා ඒ අදහස ඉහළින්ම පිළිගත්තා.

රජතුමා ප්‍රීතියෙන් සිටින පුද්ගලයෙක් සොයා රාජ පුරුෂයෝ රට පුරාම යැව්වා. ගම් නියම්ගම් සිසාර සෙව්වත් රාජ පුරුෂයින්ට ප්‍රීතියෙන් සිටින පුද්ගලයෙක් සොයා ගන්න බැරි වුණා. කාලයක් ගත වුණා. ඈත පිටිසර ගමක ඉතාමත් සතුටින් පුද්ගලයෙක් වාසය කරන බව රාජපුරුෂයින්ට ආරංචි වුණා. ඔවුන් ඔහු සොයාගෙන ගියා.

“ඇත්තද ඔබ සතුටින් ඉන්නවා කියන්නේ?”

“අපොයි ඔව්. මම තමයි මේ ලෝකේ සතුටින්ම ඉන්න මනුස්සයා.”

රාජපුරුෂයින් ඔහුව රජමාළිගයට කැඳවාගෙන ගියා . ඔහු කමිසයක් ඇද නැති බව රජතුමා ඈත එන විටම දැක්කා. ඒත් ඒ මුණේ සතුට උතුරා යන බව පෙනුණා.

“මොකද තමුන් කමිසයක් නැතිව ආවේ? ”

“අනේ දේවයන් වහන්ස මට කමිසයක් නැහැ. මම කවදාවත් කමිසයක් ඇදලත් නෑ. මට කවදාවත් කමිසයක් තිබිලත් නැහැ.”

සතුට කාටවත් දෙන්නවත් කාගෙන්වත් බලෙන් ගන්නත් බැහැ. තමන්ට ලැබෙන දෙයින් තමන්ට තියෙන දෙයින් සෑහීමට පත් වෙනවනම් එතන තමයි සතුට තියෙන්නේ....

(අන්තර්ජාලයෙනි)
රංගන සජීව
ප්‍රාදේශීය ලේකම්

පැහැසර අහිමන්
කළු එළි දුටුහැටි

වරකාපොල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සියලුම අංශවල නිලධාරීන්ගෙන්ගේ සැඟවුණු කලා දක්ෂතා එළි දුටු පැහැසර අහිමන් 2024 තෙවැනි වරටත් තුල්හිරිය මාස් හොල්ඩින් ඇතීනා ශ්‍රවණාගාරයේ ඉතා විචිත්‍රවත් අන්දමින් පැවැත්විය. කාර්යාලයේ නිලධාරීන් සිය රාජකාරී කටයුතු නොපිරිහෙලා ඉටු කරමින් ලද විරාමයකදී තම නැටුම් ගැයුම් වැයුම් ආදී නේක දස්කම් වේදිකාව මත එදා වර්ණවත් අන්දමින් ගෙන හැර පෑ අන්දම අපූරු ය. රාජකාරී කාර්යබහුලත්වයෙන් මිදී මානසික සුවතාව ඇති කරමින් සහෝදර නිලධාරීන් අතරසුහදත්වය, සහයෝගය, සාමූහිකත්වය ඇති කරමින් මහජන හිතෙෂී මහජන සේවයක් ස්ථාපිත කිරීම මෙහි අරමුණු අතර වේ.

වේරගල ශාරීරික ආබාධිත පුනරුත්ථාපන ආයතනයේ ශ්‍රමදානයක්

වරකාපොල ප්‍රාදේශීය ලේකම් රංගන සජීව මහතාගේ උපදෙස් හා මඟපෙන්වීමෙන් ආර්ථික සංවර්ධන නිලධාරීන් විසින් වේරගල ශාරීරික ආබාධිත පුනරුත්ථාපන ආයතනයේ තීන්ත ආලේප කිරීමක්, ශ්‍රමදානයක් සහ දහවල් දානමය පිංකමක් ආයතනයේ පාලක මණ්ඩලයේ සහයෝගය ඇතිව සිදු කරන ලදී.

විශේෂ අවශ්‍යතා ඇති දරුවන්ට පාසල් උපකරණ බෙදා දෙයි

වරකාපොල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අධ්‍යාපනයට දක්ෂතා දක්වන විශේෂ අවශ්‍යතා ඇති දරුවන් හා තනි මාපිය පවුල්වල දරුවන්ට පාසල් උපකරණ ප්‍රාදේශීය ලේකම්තුමාගේ සහ සහකාර ප්‍රාදේශීය ලේකම්තුමිගේ මූලිකත්වයෙන් කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශයේ ශ්‍රම වාසනා අරමුදලේ අනුග්‍රහකත්වයෙන් සිදු කෙරුණි. මෙහි සංවිධානය අප කාර්යාලයේ සමාජ සේවා අංශයයි.

අන්තර් ක්‍රීඩා සමාජ තරගාවලියේ මෙවර ශූරයෝ තෝලංගමුව ලයන්ස්

48 වැනි ජාතික මහා ක්‍රීඩා උළෙලට සමගාමීව වරකාපොල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස අන්තර් ක්‍රීඩා සමාජ තරගාවලිය පසුගියදා තෝලංගමුව මධ්‍ය මහා විද්‍යාලයේ ක්‍රීඩා පිටියේදී ඉතා ජයග්‍රාහී අන්දමින් පැවැත්විණි. වරකාපොල ප්‍රාදේශීය ලේකම් රංගන සජීව මහතාගේ මූලිකත්වයෙන් හා මඟපෙන්වීමෙන් පැවැති මේ තරගාවලියේ වරකාපොල ප්‍රාදේශීය කොට්ඨාස නියෝජනය කරමින් ක්‍රීඩා සමාජ රැසක් සහභාගි විය. මෙහි සමස්ත තරගාවලියේ ශූරතාවය තෝලංගමුව ලංකා ලයන්ස් ක්‍රීඩා සමාජය දිනාගත් අතර අනුශූරතාවය මොරවක ශක්ති ක්‍රීඩා සමාජය දිනා ගනු ලැබිණි. ඒහි ජයග්‍රාහී කණ්ඩායම්වල කුසලාන , පදක්කම්, තැගි හා සහතික පත්‍ර බෙදා දීම අප ප්‍රාදේශීය ලේකම්තුමා විසින් සිදු කළ අතර මේ සඳහා අනුග්‍රහය පළාත් ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව හා ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවෙනි. මෙහි සංවිධානය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ක්‍රීඩා නිලධාරී රුවන් ජේරිසූරිය මහතා විසිනි.

කාන්තාවන් සවිබල ගන්වන්නට වරකාපොල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් අතහිත

මෙවර "ඇයට ශක්තිය දැයට ප්‍රගතිය" තේමාවෙන් ජාත්‍යන්තර කාන්තා දින සැමරුම ඉතාමත් සාර්ථකව ප්‍රාදේශීය ලේකම් රංගන සජීව මහතාගේ හා සහකාර ප්‍රාදේශීය ලේකම් කවිඟල්‍යා බණ්ඩාර මහත්මියගේ මූලිකත්වයෙන් පසුගියදා ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ශ්‍රවනාගාරයේදී පැවැත්විණි. එදින කාන්තා ව්‍යවසායිකාවන් ඉලක්ක කරගනිමින් ඇය සවිගන්වන්න කාන්තා ව්‍යවසායකත්වය පිළිබඳ දැනුවත් කිරීමක් වරකාපොල කොමර්ෂල් බැංකුවේ විධායක නිලධාරී රුමින්ද බණ්ඩාර මහතා විසින් පැවැත්විය. එහිදී දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ජ්‍යෙෂ්ඨ උපදේශන නිලධාරී රේණුකා ජයරත්න මහත්මිය විසින් තවත් හරවත් දේශනයක් සිදු කළ අතර වනිතා සංවර්ධන නිලධාරී නියෝමාලි සුදසිංහ මහත්මිය විසින් ස්වයං රැකියාවන්ට කාන්තා ව්‍යවසායිකාවන් යොමු කිරීමේ අරමුණින් දේශීය ආහාර සැකසීමේ පුහුණු වැඩසටහනක් ද පැවැත්විය. ඒ අවස්ථාව විර්ණවත් කරමින් දැදිගම පැරකුම කාන්තා කාර්ය සංවිධාන සාමාජිකාවන් විසින් අලංකාර නර්තනයක්ද ඉදිරිපත් කෙරිය. වරකාපොල කොමර්ෂල් බැංකුවේ මූලික අනුග්‍රහයෙන් පැවැත් වූ මේ වැඩසටහනට වරකාපොල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ කාන්තා සංවිධානවල නිලධාරීන්, සාමාජිකාවන්, ව්‍යවසායිකාවන්, පෙර පාසල් ගුරුවරියන් හා කාර්යාල නිලධාරීන් සහභාගි විය. මෙහි සංවිධානය වනිතා සංවර්ධන නිලධාරී කෝකිලා හපුවිට මහත්මිය විසිනි.

මහරගම අපේක්ෂා රෝහලට ලේ දන් දීමේ වැඩසටහනක්

මහරගම අපේක්ෂා රෝහලේ හදිස්සි අවස්ථාවක් මත ලේ දන්දීමේ වැඩසටහනක් වරකාපොල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ 2024.04.30වන දින ඉතාමත් සාර්ථක අන්දමින් පැවැත්විය. වරකාපොල ප්‍රාදේශීය ලේකම් රංගන සජීව මහතාගේ මඟපෙන්වීම හා උපදෙස් මත සංවිධානය වූ මේ මහඟු පින්කම සඳහා ප්‍රදේශවාසීන් බොහෝදෙනෙක් සහ වරකාපොල කාර්මික විද්‍යාලයේ විදුහල්පතිතුමන්ගේ සහයෝගීත්වයෙන් සිසුන් විශාල ප්‍රමාණයක් සම්බන්ධ විය. ග්‍රාම නිලධාරී මහත්ම මහත්මීන්ගේ අනුග්‍රහය හා කාර්යාලීය නිලධාරීන්ගේ නොමසුරු දායකත්වය මත ක්‍රියාවට නැංවුණු මෙම සත්ක්‍රියාව සඳහා අපේක්ෂිත ප්‍රමාණයටත් වඩා පැමිණ අත්වැල් බැඳ ගනිමින් මියැදෙනා හදවතට පණනලක් වන්නට රුහිරු බිඳක් දන් දුන් සියලුමදෙනාට ස්තුතිපූර්වක වන්නෙමු.

රටට ඉන්ධන නැති - වැඩට බය නැති නිල දරුවෝ

මේ පහල ලෙනගල ග්‍රාමයයි. ඔහු ආර්ථික සංවර්ධන නිලධාරී ඉදුනිල් සේනාරත්න. වචනේ පරිසමාප්ත අර්ථයෙන්ම ඔහු ගමේ ජනතාවගේ ආර්ථිකය සංවර්ධනයට උරදෙන නිලධාරියෙක්. පසුගියදා ඔහුගේ අදහසකට වරකාපොල ප්‍රාදේශීය ලේකම්තුමාගේ හා සහකාර ප්‍රාදේශීය ලේකම්තුමියගේ මග පෙන්වීම හා මාර්ගෝපදේශකත්වයෙන් පහල ලෙනගල ගමේ ජනතාවගේ ශ්‍රමයෙන් අපූරු වැඩක් කළා. ඒ ගමේ ශ්‍රම ශක්ති සංගමය විසින් පවත්වාගෙන යන සති පොල සඳහා ස්ථිර ගොඩනැගිල්ලක් සංගමයේ සාමාජිකයන්දායකත්වයෙන් විවෘත කිරීමයි. ඒ 2023.03.29 වැනිදා. විවෘත කළේ කෑගලු දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී උදයකාන්ත ගුණතිලක මැතිතුමා, සහකාර දිස්ත්‍රික් ලේකම් මල්ෂා ප්‍රියදර්ශනී මහත්මිය සහ අප ප්‍රාදේශීය ලේකම් රංගන සජීව මහතා විසින්. මේ අවස්ථාවට ලෙනගල රජමහා විහාරස්ථානයේ විහාරධිපති අම්පේ සීවලී ස්වාමීන් වහන්සේ ඇතුලු විහාරවාසී ස්වාමීන් වහන්සේලා හා රාජ්‍ය නිලධාරීන් ශ්‍රමශක්ති සංගමයේ නිලධාරී ඇතුලු සියලුම සාමාජිකයින් හා ප්‍රදේශවාසීන් රැසක් සහභාගි වුණා. එදා තවත් සුවිශේෂී දෙයක් වුණා. ඒ තමයි ඔහුගේ මූලිකත්වයෙන් ප්‍රජා එකමුතුව ආරම්භ කර පවත්වාගෙන යන මේ සංගමයේ එක් ලක්ෂ තිස් දහසක පමණ වටිනා ස්වයං රැකියා සඳහා අවශ්‍ය උපකරණ අමුද්‍රව්‍ය සාමාජිකයින් දහසය දෙනකුට ලබා දුන්නා. ඒ වගේම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ සිදුවන සත්ත්ව හානි පිළිබඳව කොට්ඨාසයේ වසම් 11 ක පවුල් 225 ක් ආශ්‍රයෙන් සකස් කළ සමීක්ෂණ වාර්තාවක් සහකාර දිස්ත්‍රික් ලේකම්තුමියට ලබා දීම සිදු කළා. 2023 වසරේ හදබිම අධිකාරිය මගින් සිදු කළ වැඩසටහනට සමගාමීව සූර්ය වැටවල් තුනක් පිරි නැමීමද ඒ අවස්ථාවේදී සිදු වුණා.

මේ ගැන පහළ ලෙනගල වසමේ එ අපට අදහස දැක්වුයේ මෙලෙසයි.

"අපි ගමේ ජනතාවගේ මූලිකත්වයෙන් තමයි මේ ශ්‍රම ශක්ති සංගමය පිහිටුවා ගත්තේ. ඇත්තටම පහල ලෙනගල වසමේ ආර්ථික තත්ත්වය නංවලීම අරමුණු කරගනිමින් පිහිටුවා ගත් ප්‍රජා එකමුතුවක් තමයි මේ. මේ සංගමය පිහිටුවා දැනට වසර දෙකක් පමණ වෙනවා. සරල සංවර්ධන ප්‍රවේශයන් මගින් පුද්ගල චර්යාවන් වෙනස් කර ග්‍රාමීය ආර්ථික සංවර්ධන ක්‍රියාවලියකට ජනතාව යොමු කිරීමට විවිධ ක්‍රමවේදයන් භාවිතා කිරීම මේ වැඩසටහන තුල පවතිනවා. මේ විදියට ග්‍රාමීය ආර්ථික සංවර්ධන කරන ක්‍රමයක් ලංකාවේ අනෙක් වසම් වල පවතින්නේද යන්න දන්නේ නෑ. නමුත් ඕනෑම වසමක් තුල ග්‍රාමීය ආර්ථිකය සංවර්ධන සඳහා ජනතාවට නොදැනෙන ලෙසට ඔවුන් යොමු කර ගැනීමට හැකි ක්‍රමයක්. මෙහිදී ග්‍රාමීය ප්‍රජාව තුලින්ම ග්‍රාමීය ජනතාව සංවර්ධන කිරීම තමයි සිදුවන්නේ"

"වසම තුල විවිධ ස්වයං රැකියා වල නිරත වෙමින් අවිධිමත් ලෙස පැවති නිෂ්පාදන ක්‍රියාවලිය විධිමත් කිරීමත් ,අලෙවි කර ගැනීමට අවශ්‍ය කටයුතු ග්‍රාමීය මට්ටමෙන් සකස් කර දීම හා ප්‍රජා එකමුතුව මගින් සකස් කරගත් අරමුදලක් මගින් අවශ්‍ය උපකරණ හා අමුද්‍රව්‍ය ඔවුන් වෙත ලබා දීම මෙහි අරමුණු වෙනවා.

එමෙන්ම ග්‍රාමීය ප්‍රජාවගේ පවුල් ඒකකයකට දැනට පවතින ආදායමට අමතර ආදායම් මාර්ගයක් හදුන්වා දෙමින් ආර්ථිකය ශක්තිමත් කර ගැනීමට අවශ්‍ය සහාය ලබාදීම මෙහි තවත් අරමුණක්.

මේ වන විට ස්වයං රැකියා වල නිරත වුවන් 16 දෙනෙකු වෙත අවශ්‍ය උපකරණ හා අමුද්‍රව්‍ය ලබා දී තිබෙනවා.එමෙන්ම ඔවුන් ප්‍රජා දායකත්වය මත නිෂ්පාදන අලෙවි කර ගැනීමට ස්ථිර ගොඩනැගිල්ලක් සකස් කර සති පොලක් ලෙස පවත්වා ගෙන යනවා.දැනට වසර දෙකක සිට මෙම නිෂ්පාදන අලෙවි පොල එළිමහන් සථානයක පවත්වා ගෙන ගියත් මේ වන විට අඩි 100ක් දිග පොල් අතු සෙවිලි කල ගොඩනැගිල්ලක් තුල පවත්වා ගෙන යාම සාධනීය තත්ත්වයක්."

අපේ ඉලක්කය ආර්ථිකයෙන් ශක්තිමත් පවුලක් ගොඩ නැගීමයි.

"මෙම කටයුතු සඳහා වරකාපොල ප්‍රාදේශීය ලේකම්තුමාගේ උපදේශකත්වය හා මඟපෙන්වීම නිරතුරුවම ලැඟෙන අතර අනෙකුත් නිලධාරීන්ගේ මෙන්ම ලෙනගල රජමහා විහාරස්ථානයේ විහාරාධිපති අම්පේ සීවලී ස්වාමීන් වහන්සේ හා නිකවැවේ ඥානානන්ද ස්වාමීන් වහන්සේගේ හා ප්‍රජා දායකත්වය ද ලැබීම මෙම කටයුතු ප්‍රශස්ත මට්ටමින් පවත්වා ගෙන යාමට ශක්තියක් වෙලා තියෙනවා."

- සංස්කාරක -

සුමධුර ධර්ම දේශනයක් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී

උතුම් තෙමඟුල සිහිගන්වමින් ඉමහත් බැති සිතින් සමරනු ලබන වෙසක් පොහෝය නිමිති කර ගනිමින් 2024.05.22 වන දින ධර්ම දේශනයක් වරකාපොල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ප්‍රධාන රැස්වීම් ශාලාවේදී පැවැත්විය.ප්‍රාදේශීය ලේකම් රංගන සජීව මහතා හා සහකාර ප්‍රාදේශීය ලේකම් කෞෂල්‍ය බණ්ඩාර මහත්මියගේ උපදෙස් හා මඟපෙන්වීම මත පවත්වන ලද මෙම පුණ්‍ය කටයුත්ත සඳහා දේශකයාණන් වහන්සේ ලෙස නෙලුන්දෙණිය ගෝතම විහාරයේ විහාරාධිපති පූජ්‍ය අස්වැද්දුමේ කමලශීල ගරු ස්වාමීන් වහන්සේ වැඩම කරන ලදී. කාර්යාල නිලධාරීන්ගේ සහභාගිත්වයෙන් වැඩසටහන පැවැත්විණි.

"වෙසක් පොහෝයට පන්සල් යමු ගම්වැසියන් සමඟ වෙසක් සමරමු"

ඓතිහාසික දැදිගම රජමහා විහාරය, ඓතිහාසික හුනුවල රජමහා විහාරය යන උභය විහාරාධිපති, සතරකෝරළ මහ දිසාවේ ද්විතීයික සංඝ නායක අතිපූජ්‍ය ඔත්නාපිටියේ විමල අභිධාන නාහිමියන්ගේ අනුශාසකත්වයෙන් සහ වරකාපොල ප්‍රාදේශීය ලේකම් රංගන සජීව මහතාගේ මෙහෙයවීමෙන් , මෙවර ගමත් සමග වෙසක් සැමරීම නිමිති කොට ගෙන, බුද්ධාභිවන්දනා වෙසක් බැති ගී සරණිය , 2024.05.23 වන වෙසක් පොහෝ දින දැදිගම විහාරස්ථ ධර්මශාලාවේදී පැවැත්විය. දැදිගම විහාරයේ ධර්මශාලාවේ එවැනි බැති ගී ආම්සපූජාවක් සිදුකළ පළමු අවස්ථාව මෙය වීම ද විශේෂත්වයක්. වැඩසටහන සංවිධානය කිරීම සඳහා ශක්තිය ලබා දෙනු ලැබුවේ විහාරාධිකාරී ස්වාමීන්වහන්ස්, වරකාපොල ප්‍රාදේශීය මහ ලේකම් කාර්යලයීය මහේෂ් මහතා දිනුෂා මහත්මිය ඇතුළු සංස්කෘතික අංශය , දැදිගම වසම් අසනි රුවන් මහතා, ග්‍රාණි නදීකා මහත්මිය ඇතුළු දැදිගම වසමේ සියලුම රාජ්‍ය නිලධාරීන්, දැදිගම සංස්කෘතික මධ්‍යස්ථානය , ස්වේච්ඡා සංවිධාන සමඟ දැදිගම ගම්වාසීන් විසිනි.

සමගි ළමා සමාජයෙන් කැරකෙන කුඩුවක්

තඹදිය සමගි ළමා සමාජය මගින් වෙසක් පුන් පොහොය නිමිතිකර ගනිමින් දර්ශනීය කැරකෙන පහන් කුඩුවක් මෙවරත් නිර්මාණය කර ප්‍රදර්ශණය කරනලදී.

බූරුන්නවේ වෙසක් සැමරුම

බූරුන්නාව වසමේ vision යෞවන සමාජයේ දරුවන් එක්ව වෙසක් බැතිගී ප්‍රසංගයක් සංවිධානය කල අතර මීට සමගාමීව බූරුන්නාව පිණිමුතු ළමා සමාජය මගින් සුමධුර ධර්ම දීගණාවක් සංවිධානය කරන ලදී

සෑයල සිත් නිවාලන
සල්ගල ආරණ්‍ය සේනාසනය

මෙවර ප්‍රාණ සගරාවෙන් අප ඔබට ඉදිරිපත් කරන්නේ වසර දෙදහසකටත් වඩා දිගු ඉතිහාසයකට උරුම කියන සබරගමු පළාතේ කෑගල්ල දිසාවේ බෙලිගල් කෝරළයට අයත් අක්කර හත්සියක පමණ විශාලත්වයකින් යුත් වැලිතැල්ල කැටහිල්ල මූකලාන නම් වූ වන ලැහැබක පිහිටා ඇති පින් බිමකටයි. මේ සල්ගල ආරණ්‍ය සේනාසනයයි.



භාවනායෝගීව වැඩවසන හිමිවරුන් වාසය කරන මේ පින් බිම උන්වහන්සේලාගේ දිවි පිවිතෙට ලබා දෙන්නේ සන්සුන් සිත නිවන පරිසරයකි.සුළඟට ලෙල දෙන සුවිසල් තුරු ලතාවල සිසිලස වටින් පිටින් ඇසෙන සියොතුන්ගේ ගී රාවය මේ ආරණ්‍ය සේනාසනයට පැමිණෙන්නන්ටද ගෙන දෙන්නේ අපූරු චමත්කාරජනක හැඟීමකි.

එකළ වළගම්බා රජු මිරිස්සගිරියෙන් පලා ඇවිත් සැඟ වී යුධ සේනා රැස් කර පුහුණු කළේ යැයි සැලකෙන්නේ මේ භූමියේය. ඒ වන විට සල්ගල ආරණ්‍ය සේනාසනයේ වැඩ වාසය කර ඇත්තේ වළගම්බා රජුට හිතවත් ඉන්දගුප්ත නම් හිමිනමකි. උන්වහන්සේගේ හිතමිතුරෙකු ලෙස වළගම්බා රජු ජීවත් වූයේ ඉතා රහසිගතවය. ගිජ්ජකූඨ ලෙන රජු ජීවත් වූ ස්ථානය ලෙස සැලකේ. රජුගේ ඇතා බැඳි ස්ථානය ඇත් බැඳි ලෙන නමින් හඳුන්වයි. තවත් ඉසිගිලි, පිප්පිලි, වේහාර සහ වේපුල්ල ආදි ලෙන් සයකි. හේමා ලෝක කුටිය, අරණායක කුටිය, අතාවුද කුටිය ණිමහව කුටිය සහ හෙයියන්තුඩුව ආදී භාවනා කුටි රාශියකි. අද වන විට ඒ ලෙන් ආරණ්‍යවාසී භික්ෂූන් වහන්සේලා භාවනා කුටි ලෙස භාවිතා කරයි.හේමාලෝක කුටිය තුළ සැකසූ සක්මන් මලුවකි. අඩි හතලිහක් පමණ දිගින් යුත් එය නිමවා ඇති අන්දම අපූරුය.

තවත් මෙහි ඇති රමණීය ස්ථානයක් වන්නේ බැලුම්ගලයි. එහි ආරණ්‍ය සේනාසනයේ සණ්ඨාර කුලුණ පිහිටා ඇත. වළගම්බා රජුගේ රාජපුරුෂයන් සතුරු ආක්‍රමණ පිළිබඳ සොයා ඇත්තේ මෙහි සිටය. අරණේ උසම ස්ථානය මෙය වන අතර අවට වටපිටාව මනරම්ව පෙනේ. ඈතින් පෙනෙන කන්දේ ඇති සිරිපා කන්ද දිස් වන්නේ නෙත් සිත් ඇදබැඳ තබා ගනිමිනි.

වළගම්බා රජ දවස යුධ පුහුණු බිමක්

සෑම තැනම ගිරව්, මයිනත්, සැළලිහිණියෝ ආදි නේක විධ කුරුල්ලන් පියඹා යති. මෙහි අක්කර භාගයක පමණ විශාලත්වයෙන් යුත් පොකුණකි. වන ලැහැබේ ගලා යන කුඩා දියපහරවල්ය. අරණේ ඇති නිහඬ බව බිඳින වතුර ඇද හැලෙන හඬකි. ඒ කුඩා වැවෙන් වතුර වතුර වැටෙන හඬයි. මහ වැවේ නෙලුම් ඕලු වර්ග රැසකි.

මේ පුදබිම වැද පුදා ගැනීමට මෙන්ම සෝෂාකාරී ශබ්දවලින් ඇත්ව හෝරාවක් ගත කරන්නටත් පෙව් විවිධත්වය දැක බලා ගැනීමට කැමැති අය හටද අපූරු ස්ථානයකි. ඓතිහාසික වටිනාකමක් ඇති මේ සල්ගල පුදබිමේ ඇති පාරිසරික සුන්දරත්වය හා ඓතිහාසික වටිනාකම මේ ආකාරයෙන්ම ආරක්ෂා කරගනිමින් අනාගත පරපුරට ඉතිරි කර තැබීමට වග බලා ගැනීම අපගේ වගකීමයි.

සටහන - වලානි හේරත්

පංචකර්ම සායනයක් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී

බෝවන රෝග හා බෝ නොවන රෝග නිවාරණය සම්බන්ධයෙන් වැඩසටහනක් පසුගිය සිකුරාදා දින (10) ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ප්‍රධාන ශ්‍රස්ථිම ශාලාවේදී පැවැත්විය. වැඩසටහන ආරම්භයේදී වරකාපොල ආයුර්වේද රෝහලේ ප්‍රජා සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී පී.ආර්.සී.ඒ අමරසේන මිය හරවත් දේශනයක් සිදු කල අතර, රින්තා වෛද්‍ය නිලධාරී සමඟ ආයුර්වේද සායනයක්ද පින්නවල පංචකර්ම ඒකකයේ වෛද්‍ය නිලධාරී ඇතුලු කාර්ය මණ්ඩලය මඟින් මීට සමගාමීව ප්‍රායෝගික පංචකර්ම සායනයක්ද පැවැත්විය. වරකාපොල ප්‍රාදේශීය ලේකම් රංගන සජීව මහතාගේ උපදෙස් හා මඟ පෙන්වීම මත සංවර්ධන නිලධාරී (දේශීය වෛද්‍ය) දිපිකා ලක්මාලි මහත්මිය ඇතුලු කාර්යාලයේ නිලධාරීන්ගේ සංවිධානය ශක්තියෙන් හා වරකාපොල ප්‍රාදේශීය සභාවේ ලේකම්තුමිය ඇතුලු කාර්ය මණ්ඩලයේ අනුග්‍රහකත්වයද වැඩසටහන සඳහා හිමිවිය. මෙම අවස්ථාවට වරකාපොල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සහකාර ප්‍රාදේශීය ලේකම්තුමිය ඇතුළු මාණ්ඩලික නිලධාරී හා කාර්යාලය නිලධාරීන් සහභාගීවිය.

මී මැසි පාලනයට අපෙන් අත හිත

කෘෂිකර්ම හා වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වූ අපනයන කෘෂි කලාප වැඩසටහන යටතේ ක්‍රියාත්මක වන මී මැසි පාලන ව්‍යාපෘතියට අදාලව එහි දෙවෙනි අදියර යටතේ මී මැසි පාලනයේ නිරතවන්නන් කෘෂි ව්‍යවසායකයන් බවට පත් කිරීමේ අරමුණින් වරකාපොල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ඉතා සාර්ථකව මී මැසි පාලනයේ නිරත වන ව්‍යවසායකයන් තිදෙනෙකු සඳහා මී මැසි පෙට්ටි 05 බැගින් හා දූමි විසුරනය බැගින් 2023/05/03 වන දින ප්‍රාදේශීය ලේකම් තුමාගේ ප්‍රධානත්වයෙන් කාර්යාලයීය පරිශ්‍රයේදී බෙදා දෙනු ලැබිණි.

සූර්යාංජලී බක්මහ උළෙල වරකාපොල මහජන ක්‍රීඩාංගනයේදී

වරකාපොල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, ප්‍රාදේශීය සභාව, පොලිසිය සහ වෙළඳ සංගමය එක්ව සංවිධානය කරන ලද "සූර්යාංජලී බක්මහ උළෙල" 2024.04.16 දිනය පුරා ලක්ඛඬ ගුවන් විදුලි හා ස්වාධීන රූපවාහිනී මාධ්‍ය ආවරණය ඔස්සේ වරකාපොල මහජන ක්‍රීඩාංගනයේදී ඉතා සාර්ථකව පවත්වන ලදී. වරකාපොල ප්‍රාදේශීය ලේකම් රංගන සජීව මැතිතුමන්ගේ ප්‍රධානත්වයෙන් සහකාර ප්‍රාදේශීය ලේකම්තුමිය, ප්‍රාදේශීය සභා ලේකම්තුමිය, පොලිස් ස්ථානාධිපතිතුමන්, ලක්ඛඬ ගුවන්විදුලි ප්‍රවර්ධන නිලධාරී, වෙළඳ සංගමයේ සභාපති, ලේකම් ඇතුළු ව්‍යාපාරික ප්‍රජාවද මේ සඳහා සහභාගි විය. බක්මහ උළෙල සඳහා තරඟ තිහක් පමණ ඇතුළත් වූ අතර මාර්ගධාවන තරඟය, අවුරුදු කුමරිය තේරීම, කඹ ඇදීම, ලිස්සන ගසේ නැගීම, කොට්ටා-පොර, ඉතා උණුසුම් තරඟ ඉසව් බවට පත්විය. විවිධ සංස්කෘතික අංගයන්ගෙන් හැඩවුණු බක්මහ උළෙල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ නර්තන කණ්ඩායම්වල නර්තනාංගයන්ගෙ විසිතුරු වූ අතර ලෙවකේ පරම්පරාවෙන් පැවත එන පියරත්න ගුරුන්නාසේගේ මූලිකත්වයෙන් සාම්ප්‍රදායික අංගම්පොර සටන් කලාව ඇසුරින් සිදු කළ ඉදිරිපත් කිරීම කාගේත් සිත් නෙත් පැහැරගත් දර්ශනීය අංගයක් බවට පත් විය.

බක්මහ හැඩ කළ "සූර්යාංජලී"

හෙළ සංස්කෘතියට මුල්තැන දෙමින් වරකාපොල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ,සූර්යාංජලී , බක්මහ උළෙල පසුගියදා කිත්සිරි විජේතුංග ක්‍රීඩාංගනයේදී ඉතා සාර්ථකව පැවැත්විණි. කාර්යාලයේ සංස්කෘතික අංශයෙන් සංවිධානය වූ ජවයෙන් හා විනෝදයෙන් සපිරි මේ බක්මහ උළෙලේ දරුවන් සඳහා විශේෂ තරඟ මෙන්ම කඹ ඇදීම, බනිස් කෑම, බෝතලයට වතුර පිරවීම, සංගීත තොප්පි තරඟය, සැඟවුණු අමුත්තා සෙවීම ආදී තරඟ රසකින් සමන්විත විය. මේ අවස්ථාවට අප ප්‍රාදේශීය ලේකම් රංගන සජීව මහතා, සහකාර අධ්‍යක්ෂ තුමිය, පරිපාලන ග්‍රාම නිලධාරීතුමා, ග්‍රාමනිලධාරීන්, ආර්ථික සංවර්ධන නිලධාරීන්, සමෘද්ධි සංවර්ධන නිලධාරීන්, සංවර්ධන නිලධාරීන්,කාර්යාල කළමනාකරණ නිලධාරීන් හා ඔවුන්ගේ පවුලේ සාමාජිකයින් සහභාගි විය.

පුංචි කවි

වැදු මව් මහ මං ඉනිං

මිනිසුන්ගේ කදුලු වැගිරෙන
වාර අපමණයි
කුමක් කරන්නද නොතේරෙයි
අපි අසරණයි
සමහරක් තැන් හරි සිතුවත්
කරන්නට බැරි දේ බොහෝමයි
කුමක් කරන්නද අපි
ඒ ඔවුන්ගේ නොතේරෙන කමයි

අම්මා සෙනෙහෙන් දුන් ඉඩම්
තම පුතුන් හට අනේ පිං සිතින්
පුතුන් හට නම් නොවැටහෙයි
එහි අගය ගැන මොහොතක් ඉතිං
ලබා ගත්තත් එලෙස දේපල
මවුන් හට සලකන සිතින්
කුමක් වෙනවද නොතේරෙයි මට
වැදු මව් මහ මඟ ඉතිං

සකුන්තලා රණසිංහ
ඉඩම් අංශය

නික්ම යෑම

බාධක කම්කටොලු
මැද හිත් හිනැස්සු...
ගිරිශිකබර හෙල් කදු
මතින් පා එසවූ....
රිදුම් දුන්නත් දෙපා
නේක දන සිනාවෙන්...
සැනින් සුවපත් වූ
කළ දස වසරක සේවය
නිමා කර ඉකුත් වූ
කාලය එළඹ ඇත
නික්මෙන්න...
ඉතින් ආයුබෝවන්
සහාය දුන් ඔබ සැමට....
නික්ම යමි
හද තුටින්...

කල්පනී බණ්ඩාර
ප්‍රාදේශීය සභාව
වරකාපොල

හඳ මාමගෙන් බිඩියක්

හැ ද මාමගෙන්
කීරියි පැණියි
ඉල්ලල දෙන හොරොන් දුවට
හඬුන් කටයි බත් දෙකටයි කියල
බඩගෙඩිය පුරවද්දි
මන් එවෙලෙ නොදැකපු
අම්මගෙ ඇස්වලනිබ ආදරයට
මට ලෝබ හිතෙන්නෙ
ටකර්න් පැලට වෙලා
ඒ ඇස් මවා ගන්න හදද්දි.

හැමදාමවගේ
ඒ වැඩෙන්
පලක් නැතිවේගත එද්දි
මට මේ ලෝකෙට එන්නෙ
හිනි මිදුම් පටලයක් ඇවිත්
උලුක්කුවට හිනාවෙද්දි.

එත් එක්කම
බිඩියක් පත්තුකරගන්නෙ
බිඩිය උරාගෙන පපුව රත්කරගද්දි
එලොව හිය
අම්ම ඇවිත්
ආදරේ පුරෝගත්තු තරහාවකින්
හිනියට පොක්කක් අනියි
කියල හිතෙන
බොලඳ බලාහොරොත්තුවත් එක්ක.

වසන් කළ යෞවනයේ
නති රැක්ක බිඟුන් කැළ...
පසක් කර
අස්වීර ආලය...
ගිය විටදී ඉගිලිලා...
කෙළිලොල් තරුණ විය
රැඟුමෙන් පැව වූ මිතු කැළ
පසක් කළ වංක බව
ගිය විටදී ඉගිලිලා...
නිරතුරුව...
දැවටෙමින් මා ළඟ
පැව සෙනෙහස
නොවෙනස්ව...
නිරුත් සදුන් විලසට...
ආදර මව්පියනි
ආදරෙයි නිබඳවම...

කල්පනී බණ්ඩාර
ප්‍රාදේශීය සභාව
වරකාපොල

Think Outside the Box

සිටියා එක් පෙදෙසක
නිල දරුවකු බල ලත්
වක්‍ර ලේඛ . අණපනත් ගෙන සාරයම
මහජන හිත සුව සඳන්නන්ගේ
ගත සුව පිණිසම
තැනුවා කාන්තා නිල ඇදුමක්
දසත පැතිරුණා...
රාවය
ප්‍රසංසා, නින්දාද එකවිට..
කොපි කල හැකි මුත් සමකල
නොහැකි අපේ ලොකු බොස්
නිවැරැදි තීරනයම ගත්තා
නිසැකවම

නිසංසලා පතිරණ
ගිණුම් අංශය

මායාකාරී අතීතය

හඳ හාමිගේ උකුලේ නැලවෙන හා
පැංචා
දඟ ඉඳන් ආයෙමත් රස කතා
අහන්න
බිච්චේ අද්දරේ බිල්ලා හැංගිලා
ඉන්න මාර ගහේ කොඳු අස්සේ
කණාමැදිරියන්ගැන මට ඕන
පුදුමයෙන් කල්පනා කරන්න
ඉහට ඉහළින් තියන බර්ම බර
පිටින් මොහොතකට මවත් හරි
බිමට අත ඇරලා සමනලුන්
පස්සෙන්ම සිනා සී දුවන්න
වැටෙන තරු කැටයකට පුලුවනිද
පුලුවනි මවම චිත්‍රයක් පෙනිලා
සිහිජයේ ශෙළවරක හැංගිලා
හිඳින්න
මවත් හැකි වෙයි ඉතිං හොරෙන්
දුවගෙන ගිහින් තරු කැටය දඟව වී
මට ඇති මවත් දැන් මහන්සි කියන්න

චතුරි ආරියරත්න
පෙරටු කාර්යාලය

මනඃ සෝයා

පාසි බැඳි දිඹාගිය ගේට්ටු කණු දිගේ
වියළි විසිරී ගිය කොළ මතින්
දුඹුරු වී ගරා වැටුණු බිත්ති පුරා
රටා ගෙතූ මකුලු දැල් අතරින්
හෝරා මවමින් වදින කණිසමේ හැඩ මවා
ඉබාගාතේ දුවන මා වවුලන්ගේ පාර දිගේ
ආවේ ඔහු සිදාදියේ සිට
මගහැරී ගිය බාලවියේ මනඃ සෝයා

දුෂානි මධුභාෂිනි
ගිණුම් අංශය

බලා ඉමි....

වෑසි බෙදන
හිල් අහස යට
සිට
බලා ඉමි
වෑටෙන තුරු
එක
දිය බිඳක්....
හිත පෙළන
ගල් හිතක් ලඟ
හිඳ
බලා ඉමි
ලඟෙන තුරු
හිති
සිසිලසක්....

හිරෝමි කහගල්ල
තුල්හිරිය

අත්දැකීම් කවි කර දසඅතේ විසිකරන රුවන් සංජීවගේ

"සතේ කවි"

සාහිත්‍යට ලැදි රජයේ නිලධාරීන් දිරිමත් කර වඩාත් තෘප්තිමත් ජනතා සේවයක් සැපයීමේ අරමුණින් අප ප්‍රාදේශීය ලේකම් රංගන සජීව මහතාගේ අදහසකට අනුව සතේ කවි කුළුදුල් කාව්‍ය නිර්මාණ සංග්‍රහයේ දොරට වැඩුම ප්‍රාදේශීය ලේකම් කාර්යාල ශ්‍රව්‍යාගාරයේදී ඉතා සාර්ථක අන්දමින් පැවැත්විණි. ගෞරවනීය මහා සංඝරත්නයත්, කැගල්ල මහදිසාපති දිස්ත්‍රික් ලේකම් ජේ. එම්. ආර්. පී. ජයසිංහ, සබරගමු පළාත් ප්‍රධාන අමාත්‍යාංශ ලේකම් ප්‍රභාත් උදාකර,කැගල්ල අතිරේක දිස්ත්‍රික් ලේකම් (පාලන) දිනීෂා රත්නායක, කැගල්ල නියෝජ්‍ය අධ්‍යක්ෂ(සැලසුම්) ගාමිණී එකනායක යන මහත්ම මහත්මීන් ද කැලණිය විශ්වවිද්‍යාලයේ පුස්තකාල හා තොරතුරු විද්‍යා අධ්‍යයන අංශයේ අංශ ප්‍රධානී ජ්‍යෙෂ්ඨ මහාචාර්ය එම්.කේ. වීරසිංහ මහතා , වරකාපොල සහකාර ප්‍රාදේශීය ලේකම් කෞෂල්‍යා බණ්ඩාර මහත්මිය, ගණකාධිකාරිතුමිය, සහකාර අධ්‍යක්ෂ (සැලසුම්), පරිපාලන නිලධාරීතුමිය, වරකාපොල ප්‍රාදේශීය සභාවේ ලේකම්තුමිය,මාණ්ඩලික නිලධාරීන් ,විදුහල්පතිවරුන් සහ කාර්යාල නිලධාරීන්, සමෘධි නිලධාරීන්, බහුකාර්ය නිලධාරීන් මෙන්ම විද්වතුන්, කලාකරුවන් හා මාධ්‍යවේදීන් රැසක් සහභාගි විය.

දැදිගම හන්දියට හිරුටත් කලින් වගේ - සාදි බණ්ඩා එනවා සිරිතකට වගේ
ජටාවකුත් හිස මත උරුමයක් වගේ - මුල් පත්වීමේ දැදිගම මතකයක් මගේ

මේ රුවන් සංජීව වික්‍රමසිංහගේ ණිසතේ කවිඋ කාව්‍ය සංග්‍රහයේ 52 පිටුවේ ණිසාදි බණ්ඩාඋ කවි පෙළෙන් උපුටා ගත්තකි. තමන්ගේ අත්දැකීම් සිය හැඟීම් සමග මුසු කරමින් අපූර්වත්වයෙන් පොදු අත්දැකීමක් බවට පෙරලීම කවියාගේ කාර්යයි. එය මනාව පිළිඹිබු කරවන ණිසතේ කවිඋ කාව්‍යය සංග්‍රහයේ මා වඩාත් සිත්ගත් කවියෙන් මෙලෙස ආරම්භයක් ගන්නට සිතුවෙමි.

ඔහු නමින් රුවන් සංජීව වික්‍රමසිංහයි. වරකාපොල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ අපේ සහෝදර සංවර්ධන නිලධාරිවරයෙකි. සිය රාජකාරී ජීවිතයේ නිතර මිනිසුන්ගේ හැඟීම් සමඟ ගැටෙන්නට සිදු වේ. මාධ්‍යවේදියෙකු හා වැඩසටහන් ඉදිරිපත් කරන්නෙකු වශයෙන් සේවය කරද්දී දස වසරකට වැඩි කාලයක් ඔහු ලැබූ මානුෂීය හැඟීම් මේ කවි වලින් සමාජය විනි විද දකින්නට සමත් වීමට තවත් හේතුවක් වන්නට ඇත. හම්බන්තොට දිස්ත්‍රිකයේ ගජනායක නම් ඇත පිටිසර ගමක ඉපදී සිය පියා දුම්රිය දෙපාර්තමේන්තුවේ නියාමවරයකු ලෙස සේවය කළ නිසා ස්ථාන මාරුවීම් සමඟ කලින් කලට ලංකාවේ විවිධ ප්‍රදේශවල පදිංචියට යෑමට සිදුවීමෙන් විවිධ මිනිසුන් ඇසුරු කරන්නට ලැබීම ඔහුට ලැබූ අත්දැකීම් සරසවියක් බඳුයැයි ඔහු ණිසතේ කවිඋ කාව්‍ය කෘතියේ සටහනක සඳහන් කරයි.

"ගම්පියසත්, වෙල් එළියත්, කොළඹ ගෙන්දගම් පොළවත්, බහුවිධ සමාජ සංස්කෘතීන් මට නුහුරු දෙයක් නොවීය.එහෙත් ගාල්ලේදී සුනාමියත්ණී හපුතලේ නාය ගිය මීරියබැද්ද ගම්මානයත් සියැසින් දැකීමට සිදුවීම අදටත් මා හද සසල කරන මතකයන් ගොන්නේ, වැඩිම බරතැබීමකි. ඉතිං මම නොලියා කවිරු ලියන්නද? කවිය නම් වූ මහා සාගර තරණයට එම අත්දැකීම් පමණක් පහුරක් නොවන බවත්, කවි සාගරයේ මම නවමත්, වෙරළ අද්දර දුහුවිල්ලක් බවත් දනිමි. නමුත් මා පිහිනීමට වෙර දරමි."

මේ ඔහුගේ අදහසයි. ඔහුගේ කුලුදුල් කාව්‍ය කෘතිය මෙලෙස අප අතට පත් වන්නට එදා මෙදා තුර අතහිත දුන් සෙනෙහවතුන් ඔහු සිහිපත් කරන්නේ කෘත ගුණ බැතියෙනි. මෙලෙස පාඨකයින් ඇලුම් කරන තවත් නිර්මාණ එළි දක්වන්නට ඔහුට සිත් පහළ වේවායි සුබ පතමින් සතේ කවි කෘතියේ සාම්ප්‍රදායෙන් ඔබ්බට ගිය මා සිත්ගත් රැඩිකල් කවියකින්ම මේ සටහන නිමා කරමි.

හැඩි වෙච්ච කුස්සියත් - ගෙයි මිදුල හැඩකළත්
ශ්‍රියාකත ආවේ නෑ - දැන් නුගක් කාලයක්....
ඉස්සර වගේ මට - කොහෙද දැන් වෙලාවක්
උඹලට වගේමයි - මහ ප්‍රශ්න කෝටියක්..

ලයිට්, වතුරට මහ බිලක් - හරියකට නෑ කෑමක්...
ඉබිගමනෙ බස් එකට - පඩියෙනුත් භාගයක්
මමත් කන්තෝරුවේ - පඩියෙ හිරකාරියක්
පාර්ට් ටයිම් කරනවා - ඕප් වෙලා පැය දෙකක්..

කොහෙද බං නැහැ නොවැ - එන්න මට වෙලාවක්...
ජීවිතය ජයගන්න - විඳවලා මහ ගොඩක්
හැරිලා බැලුවම පෙනුණේ - කතිරයේ වැරැද්දක්
(ශ්‍රියා කාන්තාවත් හිරකාරියක්?)

-සංස්කාරක-

ජී. පොඩි මැණිකේ

රටේ ආර්ථිකයට ව්‍යාපාරවලින් ලැබෙන්නේ මහඟු දායකත්වයක්. පුංචි කාලේ දරුවෙකුට ලබා දෙන ප්‍රතිශක්තිකරණ එන්නතක් වගේ. රටේ ආර්ථිකය ගොඩ නගන්න වගේම කඩා වැටෙන හැම මොහොතකම ව්‍යාපාරවලින් ලැබෙන ප්‍රයෝජනය අතිමහත්. ස්වයං රැකියාවක් කියන්නෙත් රටේ ආර්ථිකයට උරදෙන කුඩා හා මධ්‍ය ව්‍යාපාරවලටම අයිති කොටසක්. රටට වගේම කාටවත් බරක් නොවී ස්වයං රැකියාවක් කරමින් පවුලේ ආර්ථිකයට සවියක් වෙන අය බොහෝමයි. ඒ අතරින් ඇයත් එක් අයෙක්. ඇය රසකැවිලි වෙළඳ පොළ ජයගත් තැනැත්තියක්.

නම කියමුද?
ජී. පොඩි මැණිකේ

ඔබේ ස්වයං රැකියාවේ ස්වභාවය ගැන කතා කළොත්?
මම කරන්නේ රස කැවිලි නිෂ්පාදනය. කොණ්ඩ කැවුම්, ආස්මී, කොකිස්, අතිරස, මුං කැවුම්, අලුවා, වැලිතලප වගේ ඕනෑම රස කැවිලි වර්ගයක් ඇනවුම්වලට මම ලබා දෙනවා. තව මම කෑගල්ල , අඹේපුස්ස , වරකාපොල අවට වෙළඳසැල්වලට මගේ රසකැවිලි නිෂ්පාදන ලබා දෙනවා.

ඔබ කොහොමද මේ රසකැවිලි නිෂ්පාදනයට යොමු වුණේ?
මගේ නැන්දම්මා බොහොම සුළුවෙන් ග්‍රාමීය මට්ටමින් රසකැවිලි හැදුවා. එයාගෙන් තමයි මම මුලින්ම රසකැවිලි හදන්න පුරුදු වුණේ. ඊට පස්සේ එයත් එක්ක එකතු වෙලා මමත් රසකැවිලි හැදුවා. හොඳ ඉල්ලුමකුත් අපට ලැබුණා. දැනට මම ළඟ 6 දෙනෙක් වැඩ කරනවා.

නිෂ්පාදන කොපමණ ප්‍රමාණයක් ඔබ වෙළඳපොළට එකතු කරනවද?
මම දවසකට කැවිලි වර්ග 3000 කට වඩා වැඩි ප්‍රමාණයක් වෙළඳපොළට එකතු කරනවා. ඊට අමතරව ඉල්ලුම් ලැබෙන විදියට සැපයුම ලබා දෙනවා. දවසකට රසකැවිලි 5000 ක වගේ ඉල්ලුමකට වුණත් සැපයුම ලබා දෙන්න පුලුවන්.

මම මුලින්ම රසකැවිලි හදන්න පුරුදු වුණේ මගේ නැන්දම්මාගෙන්

මේ වගේ ස්වයං රැකියාවක් ඔබේ ආර්ථිකයට සවියක් වුණේ කොහොමද?
මගේ සැමියා විවිධ සේවා සමුපකාර සමිතියේ රියදුරෙකු විදියට සේවය කළේ. මට දුවලා දෙන්නෙක් ඉන්නවා. ලොකු දුව හෙදියක් විදියට සේවය කරනවා. පොඩි දුව තමයි ලංකාවේ ලාබාලතම උප්පැන්න විවාහ මරණ රෙජිස්ට්‍රාර්. ඒ දෙන්නම විවාහකයි.

ඇත්තටම මගේ සැමියා රියදුරෙකු විදියට සේවය කරලා ගන්න වැටුප දරුවන්ට උගන්වන්න ගෙදර දොරවල් හදාගන්න ප්‍රමාණවත් නැහැ. මේ රසකැවිලි නිෂ්පාදනයෙන් ලැබෙන ලාභය තමයි අපේ පවුලේ ආර්ථිකයට හයියක් වුණේ. ඒ වගේම මම අක්කර දෙකක විතර ග්‍රැගන්ට් ෆෑට් වගා කළා. එකෙනුත් මම හොඳ ආදායමක් ලබා ගත්තා. ස්වයං රැකියාවක් කරනවා කියන්නේ අභියෝගයක්. ඒ වගේම තමයි ලොකු වෙහෙසක්. ඒත් මම ගෙදරට වෙලා දරුවෝ බලාගෙන ගෙදර වැඩ විතරක් බලාගෙන හිටියනම් අපට අද මේ ඉන්න මට්ටමින් ජීවත් වෙන්න බැරි වේවි.

ඔබේ රසකැවිලි ව්‍යාපාරය තවත් දියුණු කරගන්න බලාපොරොත්තු වෙන්නේ කොහොමද?
මට වයස 63 යි. රජයේ රැකියාවක් කළානම් විශ්‍රාමිකයි. ඒත් මම තවම වැඩ කරනවා. රස කැවිලි හොඳ ප්‍රමිතියට වෙළඳපොළට එකතු කරනවනම් හොඳ ඉල්ලුමක් ලැබෙනවා. වෙළඳ පොළ ඉල්ලුම හදාගන්න එක අමාරු නැහැ. දැනට තලගුලි මම සුළුවෙන් කරගෙන යන්නේ. මට විදාතා එකෙන් තලගුලි හදන මැෂිමක් දෙනවා කිව්වා. ඒක ලැබුණට පස්සේ තලගුලි නිෂ්පාදනය වැඩි කරගන්න ඕනෑ. තවත් සේවක පිරිසක් එකතු කරගෙන රස කැවිලි බෙදා හැරීම ටිකක් වැඩි කරගන්න ඕනෑ. ඒ වගේම අපට හරියට මේ නිෂ්පාදන හදන්න ස්ථානයක් නැහැ. මගේ ගෙදරමයි හදන්නේ. රජයේ ආයතනයකින් හරි දේශපාලනයෙන් හරි මට රසකැවිලි හදන්න ස්ථානයක් හදාගන්න උදව් කරනවනම් ගොඩක් හොඳයි. ඒ වගේ ඉල්ලීමක් කරන්න මං කැමැතියි.

0717769166
-මාහේන-
බෙලිගල
වරකාපොල

-සංස්කාරක-

කෙටි බැහැ

ඔබගේ කාර්යයන් සරල කර ගැනීම සඳහා

විනාඩි 5ක් සහතික ඔබේ අතට

උප්පැන්න,විවාහ හෝ මරණ සහතික පිටපත් ලබා ගැනීමට රෙජිස්ට්‍රාර් අංශය වෙත පැමිණෙන ඔබ අනන්‍යතාව තහවුරු කළ යුතු වේ. මේ සඳහා ජාතික හැඳුනුම්පත, රියදුරු බලපත්‍රය, විදේශ ගමන් බලපත්‍රය, දුරකතන අංකය, ලිපිනය ඉදිරිපත් කළ හැකිය. සියලුම පිටපත් ලබා දෙන්නේ **ebmd** දත්ත පද්ධතිය මගින් දිවයින පුරා සම්බන්ධ වී ඇති ජාල පද්ධතිය මගිනි. මේ මගින් විනාඩි **5** ක් වැනි කෙටි කාලයකින් ලබා ගත හැකියි. **1960** සිට **2021** දෙසැම්බර් මස දක්වා දිවයින පුරා ඇති ඕනෑම ස්ථානයකට අදාලව සහතික ලබා ගත හැකියි. ඔබට පැමිණීමට අපහසු නම් **speed post** මගින් නිවසටම සහතික ගෙන්වා ගැනීමේ පහසුකම දැන් සපයා ඇත.

Speed post මගින් සහතික ඔබේ නිවසටම

මෙම සබැඳිය ඔස්සේ නිවසටම සහතික ගෙන්වා ගැනීමේ පහසුකම සලසා ගන්න

https://online.ebmd.rgd.gov.lk

මෙහිදී ඔබ වඩාත් දැනුවත් විය යුත්තේ උප්පැන්න සහතිකයේ ඔබට අදාල කොට්ඨාසය පිළිබඳවයි. වරකාපොල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ උප්පැන්න, විවාහ, මරණ කොට්ඨාස 3 කි.

1 කීරවැලි බටහිර පත්තුව
2 කීරවැලි නැගෙනහිර පත්තුව
3 ඕතර පත්තුව

වරකාපොල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ උප්පැන්න, විවාහ, මරණ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාරු

බෙලිගල් කෝරලේ කීරවැලි බටහිර
පී.ආර්. එල්. පතිරණ,
පතිනිවස,
අඟුරුවැල්ල පාර,
වරකාපොල.
0715243298

කීරවැලි පත්තුව නැගෙනහිර
ඒ දීපානි ප්‍රියංගා
වේරගල පාර,
අල්පිටිය, ගලපිටමඩ
0717691115

කීරවැලි පත්තුව ඕතර පත්තුව
හර්ෂනී චම්පිකා තිලකරත්න,
බංගලා තැන්න,
නුවර පාර,
නෙලුන්දෙනිය.
0771244287

වැඩිදුර විස්තර - www.rgd.gov.lk
011 28 89 518

ඔබටත් ප්‍රාණ ඉඩහසර....

වරකාපොල කොට්ඨාසයේ ඔබෙත් දරුවන්ගෙන් නිර්මාණශීලි හැකියාවන්ට අවස්ථාව ලබාදීමට අප සුදානම්. ප්‍රාණ ත්‍රෛමාසික සඟරාවේ ලබන කලාපයට ඔබේ නිර්මාණ praanamagazine@gmail.com හෝ 0706368628 දුරකතන අංකයට Whatsapp කරන්න. ඔබේ අදහස්, යෝජනා, ගැටළු ද අපට යොමු කරන්න.. මේ ඉඩහසර ඒ සඳහාමය.

-සංස්කාරක-

දිනුම් කණුව

මනස සහ මොළය අතර
හුදකලා වීමට..



වෙනස්වන්න. නමුත් සෙමෙන් අරඹන්න.
වැදගත් වන්නේ වේගය නොව දිශාවයි.
- Paulo Coelho -



හුදෙක් ජලය දෙස බලා සිටීමෙන්
ඔබට සයුර තරණය කිරීමට අපහසු වනු ඇත.
- Rabindranath Tagore -

හැමෝම ලෝකය වෙනස් කිරීමට
උත්සාහ කරන නමුත්
කිසිවෙකු තමාව වෙනස් කිරීමට සිතන්නේ නැත.
- Leo Tolstoy -

හොඳ ඔලුවක් සහ හොඳ හදවතක්
හැමවිටම පැරදිය නොහැකි
සම්මත් සඛදනාවකි
- Nelson Mandela -



පුන්‍යා සුදසිංහ
ආයතන අංශය

පොඩ්ඩන්ගේ රෑ රටා

ඒ.ඒ. මිතිල නිමාදින්
(Nursery)
Buddhist international college

එච්.ඒ.දසුනි තීක්ෂණ
කෑ/වර/අල්ගම
මධ්‍ය මහා විද්‍යාලය

කේ.ජී.දෙවුන්දි සම්පබා
රෝයල් ජාත්‍යන්තර
පෙර පාසල

ප්‍රශ්නය

කුඩා ගමක, ගැඹුරු තීක්ෂ්ණ බුද්ධියක් ඇති මහලු මිනිසෙක් ජීවත් විය. දිනක් තරුණයෙක් ඔහු වෙතට ආවේ ඔහුව කලබලයට පත් කළ ප්‍රශ්නයක් සමගිනි.

"මාස්ටර්, මම ජීවිතයේ අරුත සොයමි. ඔබට මට තේරුම් ගැනීමට උදව් කළ හැකිද?"

මහලු මිනිසා සිනාසෙමින් තරුණයාට ඇවිදීමට තමා හා එක්වන ලෙස ආරාධනා කළේය. තරුණයා කුතුහලය පිරි හදවතින් මහලු මිනිසාගේ පසුපස ගමන් කලහ. ගොවියෙක් බීජ වපුරන කුඹුරකට ළඟා වන තෙක් ඔවුහු නිහඬව ඇවිද ගිය අතර මහලු මිනිසා තම හඬ අවදි කලහ.

"ගොවියා දෙස බලන්න. ඔහු මෙම බීජ රෝපණය කරන්නේ, බීජ පැළ වේ දැයි නොදැන ය. කාලගුණයෙන් කුමක් සිදුවේදැයි නොදැනය. සතා සිව්පාවන්ගෙන් කුමන හානියක් සිදුවේදැයි නොදැනය.
එහෙත්, ඔහු විශ්වාශයෙන් හා බලාපොරොත්තුවෙන් බීජ සිටුවයි"

ඔවුන් නැවත ගමන ආරම්භ කල අතර ගලා බසින ගඟකට ඔවුහු ළඟාවිය.

"ගංගාව දෙස් බලන්න.එය නිමක් නැතිව ගලා යයි. තම මාර්ගයේ ඇති බාධක වලට අනුවර්තනය වෙමින් ඉක්මන් නොවී තමන්ගේම මාර්ගයක් නිර්මාණය කරගනියි"

අවසානයේ ඔවුන් කඳු මුදුනකට ළඟාවිය. ඔවුන් හිරු බැස යන දෙස බලා සිටින විට, මහලු මිනිසා නැවතත් කතා කළේය.

"ජීවිතය යනු ගොවියාගේ කෙත, ගලා යන ගංගාව සහ බැස යන සූර්යයා වැනි ය. එය සිදුවෙන දේදේ කෙරෙහි විශ්වාශය, අනුවර්තනය වීම සහ සෑම මොහොතක්ම වටිනා මොහොතක් බව මතක්කරල දෙනවා."

ජීවිතයේ අරුත තනි පිළිතුරක් නොව අත්දැකීම් සහ ඉදිරි දර්ශනවල ගමනක් බව තේරුම් ගත් තරුණයා හිස සැලුවේය.

අපේ නිවහන

වසර මුල දී ප්‍රතිඥා දී පිරිත් සෙත් අනුභස් මැදින්
රජයේ සේවය අරඹමු පැහැදී මහජන හිතැතිව පිබිදෙමින්
කාගෙත් සිත් වල උද්‍යෝගය ඇත
පොදු ජන හිතැතිව සේවය සැමතැන
ලස්සන නිල ඇඳුමක් දැන් ඇත.අපගේ පහසුව නිති සලසා ඇත

ප්‍රාණ වායුව සම වෙන්
දේපල නම් මෙයයි අන්පත්
ශීත උණුසුම නොවෙයි වැදගත්
යදම් මෙන් සවිමත් ය මෙහෙයන්

මහිලා සංගමය බලවත්
හදපිරි සතුටින් සැමදා හිතවත්
ලේඛන නම් ඉතින් වැඩියි කවදත්
කවුරු ආවත් වැඩේ ඉක්මන්
නම් කල කාර්යාලය මුලකුරු වලින් කවියෙන්
නිවසයි අපේ කවදත් සුපසන්

අතිරේක දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්
ඉසිරා ඒකනායක

ප්‍රාණ ත්‍රෛමාසික අන්තර්ජාල සඟරාව
ප්‍රාදේශීය මහලේකම් කාර්යාලය
වරකාපොල
praanamagazine@gmail.com

උපදේශකත්වය
වරකාපොල ප්‍රාදේශීය මහලේකම් කාර්යාලීය ප්‍රාදේශීය ලේකම්
රංගන සජීව
වරකාපොල ප්‍රාදේශීය මහලේකම් කාර්යාලීය සහකාර ප්‍රාදේශීය ලේකම්
කෞෂල්‍යා බණ්ඩාර
සංස්කාරක
චලානි ධිවන්ති හේරත් (සංවර්ධන නිලධාරී) 0776057275
සම්බන්ධීකරණ සහය
ධනේෂි ජයතිලක (තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සහකාර)
නිසංසලා පතිරණ (සංවර්ධන නිලධාරී)
ශාන්ත පුෂ්පකුමාර (සංවර්ධන නිලධාරී)
අශෝක නුවන් කුමාර (සංවර්ධන නිලධාරී)

පරිගණක අක්ෂර හා පිටු සැකසුම
යසින්ත ප්‍රදීප්මාල් (සංවර්ධන නිලධාරී) 0712637846
සංවිධානය
මාධ්‍ය ඒකකය
ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලය - වරකාපොල